# ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය

**1.** ව්‍යාපෘතිය - මී මැසි ගම්මානය පිහිටුවීම

**2.** අංශය - කෘෂිකර්ම

**3.1** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ස්ථානය

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ කොට්ඨාසය | ගොවි ජන සේවා බල ප්‍රදේශය | ග්‍රාම නිළධාරි වසම |
|---|---|---|---|
| ගාල්ල | යක්කලමුල්ල | යක්කලමුල්ල | ග්‍රා.නි වසම් 3ක් තුළ ව්‍යාප්ත වේ |

**4.** ව්‍යාපෘතියේ පසුබිම

**4.1** හැදින්වීම

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජීවත්වන ජනතාවට ආදායම් ලැබිය හැකි මාර්ගයක් ලෙසත් ලොකු කුඩා ,දුප්පත් පොහොසත් හා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ඕනෑම කෙනෙකුට ආරම්භ කළ හැකි විනෝදාත්මක කාර්යක් ලෙසත් මීමැසි පාලනය හදුන්වාදිය හැක.මී පැණි, මී ඉටි , රාජ ජල්ලි හා මී විෂ යනාදිය මී මැස්සාගෙන් ලබා ගත හැකි අතර භෝග පරාගනය දිරිගන්වමින් අස්වැන්න වැඩි කිරීමට ද මී මැස්ස දායක වේ. මෙසේ මහගු කාර්යක් ඉටු කරන මීමැස්සා විසින් ශක්තිමත් කරවන ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය තවදුරටත් නගා සිටුවීමට මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිතය.

**4.2** ව්‍යාපෘතියේ අරමුණු

I. මී පැණි නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් අතිරික්ත නිෂ්පාදන සඳහා ඉහළ වටිනාකමක් ලබා දීම.
II. යටතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ගොවීන් අතර සම්බන්ධතා ශක්තිමත් වීම
III. නව රැකියා අවස්ථා බිහිකිරීම

**4.3** ව්‍යාපෘතිය මගින් විසදීමට යෝජිත ගැටළු

මී මැස්සා වනාහි ස්වභාව ධර්මයේ අපූර්ව නිර්මාණයක් වන අතර මිනිසාට බෙහෙවින් ප්‍ර යෝජනවත් සත්වයෙක් ද වේ. නාගරීකරණය වීමත් අධික ලෙස කෘෂි රසායනික භාවිතා කිරීමත් සමග මී මැසි සම්පත විනාශ වීමේ තර්ජනයකට මුහුණපෑම ඉතා අහිතකර තත්වයකි. එබැවින් භෝග පරාගනය අඩුවීම තුළින් භෝග අස්වැන්න අඩු කරන බැවින් ආහාර සුරක්ෂිතතාවයට ඍජු බලපෑමක් ඇති කරනු ලැබේ. වර්තමානය වන විට දී ඖෂධීය ගුණයකින් යුත් මී පැණි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන දුර්ලභ වී තිබේ.උක්ත ගැටළු නිරාකරණය කර ගැනීමෙහි ලා මෙම ව්‍යාපෘතිය කාලෝචිත ව්‍යාපෘතියක් ලෙස යොජනා කිරීමට අපේක්ෂිතය.

**4.4** ඉලක්ක ගත ප්‍රතිලාභීන්ගේ සංයුතිය/විස්තර

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැනට මීමැසි පාලනය සිදුකරන ගොවීන් හා ග්‍රාමීය ජනතාව

**5.**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ක්‍රමවේදය

- ✓ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මීමැසි පාලනය සාර්ථකව සිදු කරන ආසන්න ග්‍රාම නිලධාරී වසම් 3ක් තෝරා ගැනීම(ආර්ථික සංවර්ධන නිලධාරී,කෘෂිකර්ම පර්යේෂන නිෂ්පාදන සහකාර නිලධාරී හරහා ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට ඉදිරිපත් කිරීමෙන් ඒ ඒ වසම් සඳහා නිර්දේශය ලබා ගනු ලැබේ.
- ✓ ඒ එක් එක් වසම්වල ගොවි සමිතිවල මී මැසි පාලනය සාර්ථකව සිදුකරන ගොවීන් දසදෙනෙකු බැගින් ගොවීන් 30ක් තෝරා ගෙන එම නාම ලේඛන අදාල වසම්වල ග්‍රාමීය කමිටු හරහා අනුමත කර ගැනීම.

මෙම ව්‍යාපෘතිය යටතේ මී මැසි පෙට්ටියක් දුම්විසුරුවනයක් හා මුහුණු ආවරණයක් ලබා දීමට නියමිතය. එම උපකරණ කට්ටලය සඳහා යන වියදමින් 25% ක් ප්‍රතිලාභීන් විසින් දැරිය යුතුය.

මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගනු ලබන ප්‍රතිලාභීන්ට කෘෂිකර්ම උපදේශක මගින් මීමැසි පාලනය සම්බන්ධ ප්‍රායෝගික පුහුණුවක්ද ලබා දීමට නියමිතය.

### 3.5 ප්‍රතිලාභීන් පිළිබද විස්තර

යක්කලමුල්ල ප්‍රා දේශීය ලේකම් කොට්ඨාසය තුළින් තෝරා ගත් ග්‍රාම නිලධාරී වසම් 5න් දැනට මී මැසි පාලනය සිදුකරන හා මී මැසි පාලනය සඳහා රුචිකත්වයක් ඇති ප්‍රතිලාභීන් 50 දෙනෙක් සඳහා මෙම ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂිතය.

## 4. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ

I. මී මැසි පාලනය ව්‍යාප්ත වීම තුළින් මී පැණි නිෂ්පාදනය ඉහළ නැංවීම.
II. භෝග පරාගනය දිරිගැන්වීම තුළින් භෝග අස්වැන්න වැඩි වීම
III. මී මැසි සම්පත සුරක්ෂිත වීම හා මී මැසි ජනපද ව්‍යාප්ත වීම
IV. ග්‍රාමීය ජනතාවට අමතර ආදායම් මාර්ග උත්පාදනය කිරීම.

## **8.වියදම් ඇස්තමේන්තුව**

| අනු අංකය | ක්‍රියාකාරකම | ඒකක මිල | ප්‍රමාණය | ඇස්තමේන්තුව | |
|---|---|---|---|---|---|
| | | | | ගොවි දායකත්වය (25%) | රජයේ දායකත්වය (75%) |
| | මී මැසි පෙට්ටි මිලදී ගැනීම | 1650.00 | 50 | 20,625.00 | 61,875.00 |
| | මුහුණු ආවරණ මිලදී ගැනීම | 650.00 | 50 | 8,125.00 | 24,375.00 |
| | දුම් විසුරුවණ මිලදී ගැනීම | 3600.00 | 50 | 45,000.00 | 135,000.00 |
| | පුහුණු වැඩසටහන් සඳහා<br>සම්පත්දායක දීමනාව<br>ආහාර සඳහා | <br>1200.00<br>80.00 | <br>5<br>50 | | <br>6,000.00<br>4,000.00 |
| | වියදම | | | | 231,250.00 |
| | පරිපාලන වියදම (3%) | | | | 6,937.50 |
| | **මුළු වියදම** | | | 73,750.00 | **238,187.50** |

සංවර්ධන නිලධාරී (කෘෂිකර්ම)

සකස් කළේ

නිර්දේශය (නිල මුද්‍රාව)

**10.**ව්‍යාපාති යෝජකයාගේ විස්තර

**10.1** ආයතනයේ නම **-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ලිපිනය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, යක්කලමුල්ල.

දුරකතන අංකය - 091-2286038

ෆැක්ස් අංකය - 091-2286038

**10.2.** ව්‍යාපෘතිය සම්බන්ධ කරගත යුතු නිලධාරියාගේ තොරතුරු

නම - එස්.එස් ලියනගුණවර්ධන

ලිපිනය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, යක්කලමුල්ල

දුරකථන අංකය - 0774232292

ෆැක්ස් අංකය -

**11.** ව්‍යාපෘතිය නිර්දේශ කිරීම

අත්සන -..........................................................

නම - .......................................................

ලිපිනය - ......................................................

දුරකථන අංකය - .......................................................

ෆැක්ස් අංකය - .........................................................